# සංකීර්ණ නාගරික දේශපාලන අවකාශයේ අඩු පහසුකම්ලාභී ඡන්දදායකයාගේ දේශපාලන චර්යාව

ඊ.එන්.කේ. පෙරේරා - දේශපාලනවිද්‍යා සහ රාජ්‍ය ප්‍රතිපත්ති අධ්‍යයනාංශය

මෙම අධ්‍යයනය මගින් අවධානය යොමු කරනු ලබන සන්දර්භය වන්නේ සංකීර්ණ දේශපාලන ව්‍යූහයක් නියෝජනය කරන මැද කොළඹ ආසනයෙහි මැතිවරණ ක්‍රියාවලියේ දී අඩු පහසුකම්ලාභී ඡන්දදායකයාගේ දේශපාලන හැසිරීම් රටාව සම්බන්ධවයි. මැද කොළඹ ආසනය තුළ මැතිවරණ සඳහා විශාල පක්ෂ සහභාගීත්වයක් පවතිද්දීත් අනෙකුත් ආසනවලට සාපේක්ෂව වසර ගණනාවක් මුළුල්ලෙහි එම ආසනයෙහි මැතිවරණ ජයග්‍රහණය දීර්ඝ කාලීනව සහ අඛණ්ඩව එක්සත් ජාතික පක්ෂය මතම කේන්ද්‍රගතව පවතින්නේ ඇයිද යනු පර්යේෂණගැටලුවයි. මේ අධ්‍යයනය ප්‍රත්‍යක්ෂමූලවාදී සහ පශ්චාත් ප්‍රත්‍යක්ෂමූලවාදී ක්‍රමවේදයන්ට අනුගතව මිශ්‍ර විධික්‍රමය යොදා ගනිමින් සිදු කරනු ලැබීය. මැතිවරණ ක්‍රියාවලිය තුළ පක්ෂ දේශපාලන ක්‍රියාකාරීත්වය කෙරෙහි බලපාන සාධක ත්‍රිත්වයක් පොදුවේ හඳුනා ගත හැකිය. මැද කොළඹ දේශපාලන බලය සඳහා තරග කෙරෙන විපරිත දේශපාලන අවකාශයකි. එකී දේශපාලන අවකාශය තුළ නාගරික අඩු පහසුකම්ලාභී ඡන්දදායකයාගේ චර්යාව ස්වකීය පැවැත්ම පවත්වා ගෙන යාම උදෙසා නිරන්තරයෙන්ම පක්ෂ දේශපාලනය මත පදනම්ව පවතී. මේ ඡන්දදායකයා අනුග්‍රාහක දේශපාලනයෙන්ම පුනර්නිෂ්පාදනය වන ජන කොට්ඨාසයකි. ඡන්දදායකයාගේ ස්වභාවය තීරණය වන්නේ එම සමාජ, දේශපාලන ව්‍යූහයෙන්ම ඔවුනොවුන්ට හිමිව ඇති සමාජ තත්වය කේන්ද්‍ර කර ගනිමිනි. ඉහත සාධක සියල්ල මගින් විශ්ලේෂණය කළ හැකි තර්කය වන්නේ නාගරික දේශපාලන අවකාශය තුළ උක්ත ඡන්දදායක චර්යාවෙහි ස්වභාවය තීරණය වන්නේ ව්‍යූහය සහ කර්තෘත්වය අතර පවතින සට්ටනය හේතුවෙන් බවයි. එනම් එකී සමාජ, දේශපාලන ව්‍යූහය මගින්ම ප්‍රතිනිෂ්පාදනය කෙරෙන යථෝක්ත සාධකවල ක්‍රියාකාරීත්වයෙහි තථ්‍යතාව මගිනි. ඒ අනුව විෂම වූ නාගරික දේශපාලන ව්‍යූහයේ සමාජ ප්‍රසාධනය සහ අනුග්‍රාහකත්වය නමැති දේශපාලන ලේබලයට මුවා වී ඡන්ද පදනම ශක්තිමත් කර ගැනීමට දේශපාලන පක්ෂ කටයුතු කරන ස්වාභාවයක් දැකගත හැකිය. උක්ත ඡන්දදායකයා එම සමාජ ක්‍රමයට දැඩිව අනුයුක්තව පවතින නිසාවෙන් දේශපාලන අනුග්‍රාහකත්වය, වාර්ගික විෂමායෝජනය, පන්තිමය විසංයෝජනය යනාදී විචල්‍යය අභිමුඛ කර ගනිමින් ඡන්ද පදනම ශක්තිමත් කර ගැනීමට එක් එක් දේශපාලන පක්ෂ නාගරික දේශපාලනය තුළ කටයුතු කරන ස්වාභාවයක් පවතින බව තර්කය කළ හැකිය.

*ප්‍රමුඛ පද: නාගරික දේශපාලනය, අඩු පහසුකම්ලාභී ඡන්දදායක චර්යාව, විපරිත දේශපාලන අවකාශය*